GMOA
ESTABLISHED IN
1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/04/30

**මාධ්‍ය නිවේදනයයි**

**යාපනය දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවය අඩාල කිරීමට දරන ප්‍රයත්නය**

යාපනය දිස්ත්‍රික්කය තුල මේ වන විට රෝහල් 54 කට වඩා පවතී, මීට යාපනය ශික්ෂණ රෝහල, තෙලිප්පලි මූලික රෝහල, පේදුරුතුඩුව මූලික රෝහල, චාවකච්චේරි මූලික රෝහල, කයිට්ස් මූලික රෝහල අයත්ය.

2013ට පෙර වෛද්‍ය නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු නිවැරදිව ක්‍රියාත්මක නොවුනි. මේ නිසා ඇති වූ වෛද්‍ය හිඟය හේතුවෙන් ආයතන 25කට වැඩි ප්‍රමාණයක් වසා තැබිණි. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වූ රෝහල්ද දැඩි වෛද්‍ය හිඟයකට ලක්ව පැවතිණි. නමුත් 2013ට පසු සෞඛ්‍ය අමාත්‍යාංශය වෛද්‍ය නිලධාරී ස්ථාන මාරු නිත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ උපරිම සහයෝගයද මෙයට පල වුයේ එය නිත්‍යානුකූල ක්‍රියාවක් බැවිනි.

මේ නිසා උතුරු පලාතේ බොහෝ වැසී තිබූ රෝහල් නැවත විවෘත කර මහජනයාට සෞඛ්‍ය සේවාව ලබා දීමට හැකි තත්ත්වයට පත්විය. නමුත් මේ වන විටත් තවත් රෝහල් 10 ක් වෛද්‍ය හිඟය නිසා විවෘත කල නොහැකි වී ඇත.

අවාසනාවන්ත තත්ත්වය නම් යාපනය ශික්ෂණ රෝහල හා චාවකච්චේරි මූලික රෝහලේ අධ්‍යක්ෂකවරුන් දෙදෙනා තම පෞද්ගලික න්‍යාය පත්‍රයකට අනුව යමින් වාර්ෂික ස්ථාන මාරු ලද වෛද්‍යවරුන් එම රෝහල් වලින් නිදහස් කිරීම මේ වන විටත් පමා කරමින් සිටීමයි.

ඉතාම සුළු පිරිසක් මේ වන විට මානව හිමිකම් කොමිසමේ යාපනය ශාඛාව ලවා මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය තවදුරටත් පමා කරවීමට කටයුතු කරමින් සිටී. මේ නිසා එම ප්‍රදේශවල ජනයාගේ සෞඛ්‍ය සේවය ලැබීමේ අයිතිය අවදානමකට ලක්ව ඇත.

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය සායි නිරංජන් : 0777225320